කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 15
වර්ණය : ඇම්බර්

WW/TC/19/05/03/15

# 'ෆොනි' අතිශයින් චණ්ඩ සුළි කුණාටුව පිළිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් 2019 මැයි මස 03 වන දින ප.ව. 04.00 ට නිකුත් කරන ලදී. (ඉදිරි පැය 24 සඳහා)

## දිවයිනට සහ දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සඳහා

සැලකිලිමත් වන්න!

මධ්‍ය-බටහිර බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ, ශ්‍රී ලංකාවට ඊසාන දෙසින් පැවති අතිශයින් චණ්ඩ සුළි කුණාටුව ('ෆොනී') මැයි 03 වන දින පෙ.ව. 11.30 වන විට යාපනය සිට ඊසාන දෙසින් කි.මී. 1330 පමණ දුරින් උතුරු අක්ෂාංශ 20.2 ත් නැගෙනහිර දේශාංශ 85.9 ත් ආසන්නව (ඉන්දියානු ගොඩබිම තුල) ස්ථානගතව පවතී. මෙම පද්ධතිය දිවයිනෙන් ඉවතට ගමන් කරමින් උතුරට බරව ඊසාන දෙසට ගමන් කරනු ඇතැයි අනුමාන කෙරේ. මේ නිසා මෙම පද්ධතියෙන් දිවයිනට වන බලපෑම ක්‍රමයෙන් අඩුවෙමින් පවතී.

## ගොඩබිම ප්‍රදේශ සඳහා:

සබරගමුව, මධ්‍යම, දකුණු, බස්නාහිර, ඌව සහ වයඹ පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. මෙම ප්‍රදේශවල ඇතැම් ස්ථාන වලට මි.මී.100-150 පමණ තද වර්ෂාපතනයන්ද ඇති විය හැක.

දිවයින හරහා විශේෂයෙන් උතුරු, උතුරු-මැද, වයඹ සහ දකුණු පළාත්වලත් අම්පාර, මොනරාගල සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවලත් විටින් විට හමන පැ.කි.මී. 50 දක්වා තද සුළං බලාපොරොත්තුවේ.



කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

මුහුදු ප්‍රදේශ සඳහා:

ඉදිරි පැය 24 සඳහා දිවයින වටා මුහුදු ප්‍රදේශ සඳහා අනාවැකිය

- දිවයින වටා නොගැඹුරු මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමන අතර සුළඟේ වේගය පැ.කි.මී. 35-45 පමණ වේ. සුළඟේ වේගය විටින් විට පැ.කි.මී 60 දක්වා වැඩි විය හැක. දිවයින වටා මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ.
- මන්නාරම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා සහ හම්බන්තොට සිට පොතුවිල් හරහා මඩකළපුව දක්වා වන ගැඹුරු මුහුදු ප්‍රදේශවල විටින් විට හමන පැ.කි.මී 50-60 දක්වා වන සුළං බලාපොරොත්තු වන අතර විටින් විට හමන පැ.කි.මී 70 දක්වා වන ප්‍රහාරාත්මක සුළං සමඟ මුහුදු ප්‍රදේශ ඉතා රළු වේ.
- බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශවල (පද්ධතියේ කේන්ද්‍රයේ සිට කි.මී. 300 දක්වා වන මුහුදු ප්‍රදේශවල) පැ.කි.මී 100-120 දක්වා වන සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී 160 දක්වා වන ප්‍රහාරාත්මක සුළං බලාපොරොත්තුවේ. එම මුහුදු ප්‍රදේශ දළ රළු සිට ඉතා දළ රළු වේ.

මේ පිලිබඳ අවධානය යොමුකරන ලෙස ධීවර හා නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

## නාවුක සහ ධීවර ප්‍රජාව සඳහා නිවේදනය

- ශ්‍රී ලංකාවට උතුරු සහ ඊසාන දෙසින් වන ගැඹුරු මුහුදු ප්‍රදේශයේ හෙට(04) දින සවස් කාලය වන තුරු ධිවර සහ නාවුක කටයුතු වලින් වලකින ලෙස ධීවරයන්ට උපදෙස් දෙනු ලැබේ.
- සෙසු මුහුදු ප්‍රදේශවල ධිවර කටයුතු වල යෙදෙන ධීවරයින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

පද්ධතියේ ගමන් මාර්ගය සහ තීව්‍රතාවය පිලිබඳ අනාවැකිය පහත සිතියමේ දැක්වේ.




මෙම නිවේදනය මේ පද්ධතිය සම්බන්දයෙන් නිකුත්කරන අවසන් නිවේදනය වේ.

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019/05/03
Time : 1604 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

Bulletin No: **15**
COLOR: **Amber**

WW/TC/19/05/03/15

## Advisory for Extremely Severe Cyclonic Storm 'FANI'

Issued by the Natural Hazards Early Warning Centre
Issued at 04.00 p.m. 03rd May 2019 (For next 24 hours)

### For Island and Deep and shallow sea areas around the Island

### PLEASE BE AWARE!

**The Extremely Severe Cyclonic Storm 'FANI' (pronounced as FONI) over West-central Bay of Bengal to the Northeast of Sri Lanka, was located near latitude 20.2N, Longitude 85.9E at 11.30 a.m. of 03rd May 2019, about 1330 km northeast of Jaffna (over Indian land). It is likely to move north-northeastwards while moving away from the island, hence the affect from this system to the island will gradually reduce.**

FOR LAND AREA:

**Showers or thundershowers will occur at times over Sabaragamuwa, Central, Southern, Western, Uva and North-western provinces. Heavy falls about 100-150 mm can be expected at some places in the above areas.**

**Strong winds up to 50 kmph can be expected over the island, particularly in Northern, North central, North-western and Southern provinces and in Ampara, Monaragala and Trincomalee districts.**



කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**FOR SEA AREA:**

Wind and sea condition forecast for next 24 hours

- Wind will be south-westerly and speed will be 35-45 kmph in the shallow Sea areas around the island. Wind speed can increase up to 60 kmph at times. Sea areas around the island can be rough at times.
- Wind speed will be 50-60 kmph and wind speed can increase up to 70 kmph at times in the deep sea areas from Mannar to Trincomalee via Kankasanturai and in the sea area extending from Hambantota to Batticaloa via Pottuvil. These sea areas can be very rough at times.
- Wind speed will be 100-120 kmph, gusting up to 160 kmph over the Sea areas (within 300 km from the center of the above system) in the Bay of Bengal and the said sea areas can be high to very high.

  Naval and fishing communities are requested to be vigilant in this regards.

## ADVISORY FOR NAVAL AND FISHING COMMUNITY

- The fishermen are advised not to venture into the northern and north-eastern deep sea areas until tomorrow afternoon.
- The fishermen at other sea areas are requested to be attentive on future advisories issued by the Department of Meteorology in this regard.

Forecast track and intensity are given in the following map:




This is the last next bulletin about the system.

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED.
Date : 2019/05/03
Time : 1608 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE